# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

# ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපාය මාර්ගික අධ්‍යයන ආයතනය

2006 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 2000 අංක 45 දරන ශ්‍රී ලංකා උපාය මාර්ගික අධ්‍යයන ආයතන පනත මගින් පිහිටුවන ලද ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKIIRSS), ආරක්ෂක, ජාතික ආරක්ෂාව, නීතිය, ආර්ථික විද්‍යාව, සංස්කෘතික සබඳතා, කෘෂිකර්මාන්තය, පරිසරය සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනය කිරීම සඳහා කැප වූ බහුවිධ පර්යේෂණ ආයතනයක් ලෙස ක්‍රියා කරයි.

ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKIIRSS) විධායක අධ්‍යක්ෂ තනතුර සඳහා පළපුරුදු පුද්ගලයෙකු බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. විධායක අධ්‍යක්ෂවරයා විශිෂ්ට කළමනාකරණ කුසලතා ඇති සහ පුළුල් රාජ්‍ය, රාජ්‍යතාන්ත්‍රික සහ අධ්‍යයන ප්‍රජාවන් සමඟ සම්බන්ධ වීමේ හැකියාව සනාථ කළ හැකි පුද්ගලයෙකු විය යුතුය.

| | |
|---|---|
| **තනතුර** | විධායක අධ්‍යක්ෂ |
| **ස්ථානය** | කොළඹ, ශ්‍රී ලංකාව |
| **වැටුප:** | 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව<br>HM 2-2-2025 Rs. [163,620 - 12 x 4,850 - 221,820/-]<br>කෙසේ වෙතත්, 2027.01.01 දක්වා වැටුප් ගෙවනු ලැබෙන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ II අනුව වේ.<br>ආරම්භක දළ වැටුප: රු.211,270/- (මූලික වැටුප- රු.142,610/-+ දීමනා-68,660/-) (දුරකථන, ජීවන වියදම් සහ ඉන්ධන දීමනාව ඇතුළත් වේ.) |
| **රැකියා වර්ගය** | පූර්ණ කාලීන |
| **ප්‍රධාන වගකීම්** | 1. ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය<br>2. ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි ආයතනයේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ඉදිරියට ගෙන යාම<br>3. බහුවිධ පර්යේෂණ නිලධාරීන් කණ්ඩායමක් කළමනාකරණය කිරීම |
| **අවසන් දිනය** | **2026 ජුලි 13** |
| **විද්‍යුත් ලිපිනය**<br>**addl. secadmin@ mfa.gov.lk** | **ලිපිනය:**<br>අතිරේක ලේකම් (පරිපාලන),<br>සාමාන්‍ය පරිපාලන අංශය,<br>විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය,<br>ජනරජ ගොඩනැගිල්ල,<br>කොළඹ 01, ශ්‍රී ලංකාව. |

## පළපුරුද්ද සහ අධ්‍යාපනික සුදුසුකම්

**සෑම අයදුම්කරුවෙකුම:**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 01 හෝ 02)**

1. ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා හා උපායමාර්ගික අධ්‍යයනය හෝ අදාල වෙනත් ක්ෂේත්‍රයක පළමු උපාධියක්

   **සහ**

   ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයනය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාල පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආයතනික සාමාජිකත්වය

   **සහ**

   පළමු උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අවුරුදු 18 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. මෙම අවුරුදු 18 න් අවම වශයෙන් අවුරුදු 5 ක් සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක සේවය කළ බවට සනාථ කළ පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක් දැරීම.

   **හෝ**

2. ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයනය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ පළමු උපාධියක්

   **සහ**

   ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්

   **සහ**

   ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක සනාථ කළ හැකි වාර්තාවක් සහ කළමනාකරණ පළපුරුද්දක් සහිත "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක්.

**සහ**

බහුවිධ කණ්ඩායම් මෙහෙයවීමට සහ පාලනය කිරීමට සනාථ කළ හැකියාව

මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.

**වයස් සීමාව**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

## අමතර සටහන්

සියලුම අයදුම්කරුවන් ආවරණ ලිපියක් (Cover Letter) සහ ජීව දත්ත පත්‍රිකාවක් (Curriculum Vitae) ඉදිරිපත් කළ යුතුය. ඒවා PDF ක්‍රමයට ඉහත සඳහන් කර ඇති විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී මුද්‍රිත පිටපත ඉදිරිපත් කළ යුතුය.

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පළ කර ඇත.

**ලේකම්,**
**විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය,**
**කොළඹ 01.**